# අලහබාද් ප්‍රශස්තියෙන් නිරූපිත සමුද්‍ර ගුප්ත චරිතය පිළිබඳ ඓතිහාසික විමසුමක්

**වසන්ත දිසානායක**

ගුප්ත අධිරාජ්‍යයේ රාජ සභාව නියෝජනය කළ හරිෂේණ නම් කවියා විසින් ප්‍රශස්ති ස්වරූපයෙන් රචිත අලහබාද් ටැම් ලිපිය ගුප්ත ඉතිහාසය හැදෑරීමට මහෝපකාරී වන මූලාශ්‍රයකි. ක්‍රි. ව. 330 - 375 අතර කාලයට අයත් මෙම ටැම් ලිපියේ කතානායකයා වනුයේ ගුප්ත රාජ වංශය දිග් විජය කළ, අසහාය නායකයෙකු වූ සමුද්‍ර ගුප්ත මහ රජු ය. අලහබාද් ටැම් ලිපිය ප්‍රශස්ති ස්වරූපයක් දරන බැවින් එය ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස භාවිත කළ යුත්තේ ඉතා කල්පනාකාරිව ය. ප්‍රශස්තියක් යනු වර්ණනාත්මක ශෛලියක් අනුගමනය කරමින් රචිත ලේඛනයකි. එබැවින් අලහබාද් ප්‍රශස්තිය යනු ගද්‍ය පද්‍ය මිශ්‍ර රාජ ස්තුතියකැයි ද ඇතැම්හු හඳුන්වති. ආනන්දය උපදවන, වෘත්ත විශේෂයන්ගෙන් බඳනා ලද, අසන්නවුන්ගේ නෙත්වලින් සතුටු කඳුළු හෙළන ලේඛනයක් වේද එය ප්‍රශස්තියක් වන අතර 'රාජ ප්‍රශස්ති' යනු එයට පර්යාය නාමයකි.[1] ප්‍රශස්ති ලේඛනයන්හි එන අතිශයෝක්තිමය කරුණු හා වර්ණනාවන් බැහැර කර, මූලාශ්‍රයෙන් ප්‍රකාශිත සිද්ධි දාමයෙහි අභ්‍යන්තරයේ සැඟවුණු ඓතිහාසික සිදුවීම් විමසුමකට බඳුන් කිරීම තුළින් එම කරුණුවල සත්‍ය අසත්‍යතාවය කවරේද යන්න හඳුනාගත හැකිය. සමුද්‍ර ගුප්ත යනු ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් කරා රැගෙන ගිය අසහාය නායකයායි. ඔහුගේ එම සටන් ව්‍යාපාරය කෙසේ සිදුවීද යන්න අනාවරණය කරන ප්‍රධාන මූලාශ්‍රය වනුයේ අලහබාද් ලේඛනයයි. එසේ හෙයින් අලහබාද් ප්‍රශස්තියෙන් ප්‍රකාශිත සමුද්‍ර ගුප්තගේ රාජප්‍රාප්තිය, දිග් විජය ව්‍යාපාරය, ඔහුගේ චරිත ලක්ෂණ, මූලාශ්‍රයේ සත්‍ය අසත්‍යතාවය යන කරුණු කොතරම් දුරකට ඓතිහාසිකත්වයෙන් අනූන ද යන්න මෙයින් විමර්ශනයට ලක් කෙරේ.

ඓතිහාසික මූලාශ්‍රය භාවිතයකින් තොරව විමර්ශනයට බඳුන් කරනු ලබන අතීත සිද්ධීන් හුදු ප්‍රවාදයන්ට හා ප්‍රලාපයන්ට පමණක්

සීමා වන අතර නිවැරදි ඉතිහාසයක් ගොඩනැගීමේදී සත්‍යයට නැඹුරු වූ ඓතිහාසික මූලාශ්‍ර භාවිතය අතිශයින් වැදගත් වේ. ඇතැම් රාජවංස හා රාජ්‍යයන් පිළිබඳව කරුණු අධ්‍යයනයේදී සාහිත්‍යය මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර නිහඬතාවක් පෙන්නුම් කරන්නේ නමුත් ඇතැම් රාජ්‍යයන් හා රාජවංශයන්ගේ ඉතිහාසය ගොඩනැගීමේදී සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයෙන් ලැබෙන ආලෝකය සුළුපටු නොවේ. ගුප්ත අධිරාජ්‍යය හා ගුප්ත රාජවංශය පිළිබඳව කරනු ලබන අධ්‍යයනයේ දී සාහිත්‍යය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයෙන් ලැබෙන ආලෝකය සුවිශේෂිත වූවකි. ''ශිලා ලිපිවලින් යම් කරුණක් ලැබේ ද එම කරුණ කාසිවලින් හා ගමන් වර්ණනාවන්ගෙන් සනාථ වෙයි. එක් මුද්‍රාවක් ලැබීමෙන් අප යම් ප්‍රතිඵලයක් ලබන්නේ නම් ඒ ප්‍රතිඵලය ශිලා ලේඛන අධ්‍යයනය කිරීමෙන්ද අපි ලබමු.''[2] යන මේ ප්‍රකාශය තුළින් ගම්‍ය වනුයේ ගුප්ත ඉතිහාසය හැදෑරීම සඳහා භාවිත කරන මූලාශ්‍රය තොරතුරු කෙතරම් දුරකට නිවැරදි ද හා ඒවා එකිනෙකින් කෙසේ තහවුරු වන්නේද යන්නයි. අලහබාද් ටැම් ලිපිය ප්‍රශස්ති කාව්‍යයක් වන හෙයින් එහි එන තොරතුරු ඉතා සුපරීක්ෂාකාරීව විමසුමට බඳුන් කළ යුතුය. අලහබාද් ප්‍රශස්තියෙන් විශේෂයෙන් ම ගුප්ත අධිරාජයෙකු වූ සමුද්‍ර ගුප්තයන් පිළිබඳව මෙන් ම ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය, එහි දේශපාලනික, ආර්ථික, සාමාජික හා ආගමික යන ක්ෂේත්‍රයන් පිළිබඳව ඓතිහාසිකමය වූ තොරතුරු රැසක් ලබා දෙයි.

සමුද්‍ර ගුප්තගේ සිංහාසනාරූඪ වීම ඔහුගේ චරිත ස්වභාවය ප්‍රශස්තියෙන් ප්‍රකට වන ආකාරය හරිෂේණ සිය ලිපියේදී පළමුව අවධානය යොමු කොට ඇත්තේ ගුප්ත රාජ වංශයෙහි අසහාය නායකයා වූ සමුද්‍ර ගුප්ත සිංහාසනාරූඪ වූයේ කෙසේ ද යන්න පෙන්වාදීමට ය. ''සභාවෙහි සිටියා වූ අමාත්‍යවරු (ප්‍රීතියෙන්) සැනසුම් සුසුම් හෙළද්දී, සමාන කුලවලට අයත් වූවෝ මැලවුණු මුහුණුවලින් යුතුව එදෙස බලා සිටියහ. පියාගේ ප්‍රේමය යොමුව තිබුණේ සමුද්‍ර ගුප්තයන් වෙතය. ඔහුගේ ප්‍රේමය කොතරම්ද යත් ලොමු ඩැහැ ගන්වන සුළු විය. තමාගෙන් පසුව මේ රාජ්‍යට එකම සුදුස්සා ඔබ යැයි දැඩිව වැළඳගෙන, සතුටු කඳුලු වගුරුවමින් ඔහු වෙත රාජ්‍ය පාලනය ලබා දුනි.''[3] යනුවෙන් ප්‍රශස්තියේ එන විස්තරයෙන් පැහැදිලි

වනුයේ පළමු චන්ද්‍රගුප්ත රජතුමා තමාගෙන් පසුව ගුප්ත රාජ්‍යය ඉදිරියට ගෙන යාමට සිටින බලවත් ම සුදුස්සා ලෙසින් සමුද්‍ර ගුප්ත තෝරා පත්කර ගත් බව ය. සමුද්‍ර ගුප්ත සිංහාසනාරූඪ වූයේ පියාගේ ආශිර්වාදය මත ය. ඔහුගේ රාජප්‍රාප්තිය සිය පියාගේ ද අපේක්ෂාව වී තිබුණු බව ඉහත විස්තරකථනයෙන් මනාව සනාථ වේ. පළමු චන්ද්‍ර ගුප්තයන්ගේ අභිමතය හා සමුද්‍ර ගුප්තගේ රාජප්‍රාප්තිය මෙසේ සිදු වූයේ නමුත් මේ අවස්ථාවේදී රාජ්‍යප්‍රාප්තිය අපේක්ෂාවෙන් තවත් පිරිසක් එදෙස බලා සිටි බවට කිසියම් ඉඟියක් ලිපියෙන් කියැවේ. 'සමාන කුලවලට අයත් වූවන් මැලවුණු මුහුණින් එදෙස බලා සිටියහ'. යන පාඨයෙන් එම අදහස ගම්‍ය වන අතර එසේ බලා සිටි සියලු කුමාරවරු අතුරින් සමුද්‍ර ගුප්ත තමාගේ අනුප්‍රාප්තිකයා වීමට සුදුස්සා බව පළමු චන්ද්‍ර ගුප්තයන්ගේ තීරණය විය. එසේම ඔහුගේ රාජප්‍රාප්තියට ඇමති ගණයා ද බෙහෙවින් සතුටට පත් වූ බව 'සභා සහෘදයන් සැනසුම් සුසුම් හෙළද්දී' යන්නෙන් පැහැදිලි වේ. සමුද්‍ර ගුප්තගේ රාජප්‍රාප්තිය ඉතා උද්වේගකාරීවූත් ප්‍රීතිමත්වූත් අවස්ථාවක් පිළිබිඹු කරයි. සිය පිය රජු වූ පළමු චන්ද්‍ර ගුප්ත ඔහුට රාජ්‍යය පැවරුවේ සතුටු කඳුලු වගුරුවමින් ඔහුව වැළඳ ගෙනයි. එම අවස්ථාව මේ සඳහා කදිම නිදසුන ලෙස පෙන්වාදිය හැකි ය. මේ සිද්ධිය පිළිබඳ ආචාර්ය ජාබ්‍රා මහතාගේ අදහස වන්නේ ''මෙම අවස්ථාවේදී පළමුවන චන්ද්‍රගුප්ත රජතුමා සිහසුන අත්හැර සමුද්‍ර ගුප්තයන්ට සිහසුන පැවරූ බවය.''[4] ජාබ්‍රා මහතා දක්වන මේ අදහස ගුප්ත අධිරාජ්‍යය සමයට අයත් 'ඉරාන්' සෙල්ලිපියෙන් ද ප්‍රකට වේ.[5]

පළමු වන චන්ද්‍රගුප්ත රජු සිය ජීවිත කාලය තුළදී ම රාජ්‍යයේ උරුමකරුවා වශයෙන් සමුද්‍රගුප්ත නම් කිරීමත්, එසේ නම් කළ අවස්ථාවේදී රාජ සභාවේ සිටි ඇතැම් රාජ කුමාරවරුන්ගේ මුහුණු අප්‍රසන්න වූ ආකාරයත් යන සිදුවීම්වලින් පෙනී යනුයේ රාජප්‍රාප්තිය සම්බන්ධයෙන් කිසියම් ප්‍රශ්නකාරි තත්ත්වයක් ඇති වී තිබුණු බව ය. ඇතැම් විට තමාගෙන් පසු රාජ්‍යය තුළ ව්‍යාකුලත්වයක් ඇති වීමේ ලකුණු පහළ වී තිබූ නිසා පළමු චන්ද්‍ර ගුප්ත රජු මෙවැනි පියවරක් ගන්නට ඇතැයි සිතිය හැකි ය. සමුද්‍ර ගුප්ත හැරුණු කොට වෙනත් කුමාරවරු තමාගෙන් පසුව රජකම අපේක්ෂාවෙන් බලා සිටියත් සමුද්‍ර ගුප්ත කුමාරයා ම රාජ්‍යයේ නියම උරුමකරුවා ලෙස තෝරා පත්කර

ගන්නට ඇත්තේ ඔහු තුළ පැවති සහජ දක්‍ෂතාවය හා එඩිතරකම නිසා බව ප්‍රශස්තියෙහි නොපැහැදිලි ලෙස දක්වෙන පස්වන හා හයවන පාඨවලින් සිතීමට ද ඉඩ තිබේ.[6] ටැම් ලිපියේ ප්‍රකාශිත කරුණුවලින් පැහැදිලි වනුයේ සමුද්‍ර ගුප්ත රජුට සිහසුනට පත්වන අවස්ථාවේදී කිසියම් කලබලකාරි තත්ත්වයකට මුහුන දීමට සිදු වූ බව ය. සමුද්‍ර ගුප්තගේ රාජප්‍රාප්තියෙන් පසුව ඔහුගේ වැඩි මහලු සහෝදරයෙකු යැයි සැලකෙන 'කාච' විසින් ඔහුට විරුද්ධව කැරලි ගැසූ බවත් ඔහු පළමු චන්ද්‍ර ගුප්තගෙන් පසුව ගුප්ත රාජ්‍යය ලබාගත් බවත් ඇතැම්හු පෙන්වා දෙති.[7] පළමු චන්ද්‍ර ගුප්තගෙන් පසුව ගුප්ත අධිරාජ්‍යයේ පාලනය සම්බන්ධයෙන් උද්ගත වූ අර්බුදකාරි අවස්ථාව තවදුරටත් මෙයින් ප්‍රකට වේ. 'කාච' ගෘහ යුද්ධයෙන් රාජ්‍යය ලබා ගත්තේ නමුදු නුබෝ කලකින් සමුද්‍ර ගුප්ත ඔහුගෙන් රාජ්‍යය පැහැරගෙන සිය බලය ගුප්ත රාජධානිය තුළ ස්ථාපිත කර ගැනීමට සමත් වූ බව ප්‍රශස්තියේ එන කරුණුවලින් ම තහවුරු වේ. විශේෂයෙන් සිය පියාගේ ආශිර්වාදයෙන් හා අනුමැතියෙන් ගුප්ත සිංහාසනය තමාට ලැබුණු බව අලහබාද් ප්‍රශස්තියේ මූලාරම්භයේදී ම සඳහන් කිරීමෙන් තම රාජ්‍ය ප්‍රාප්තියේ නීත්‍යානුකූල බව තහවුරු කිරීමට කටයුතු කළ බව කිව යුතු ය.

සමුද්‍ර ගුප්ත චරිතය හා ඔහුගේ ස්වභාවය කවර ස්වරූපයක් ගත්තේ ද යන්න ප්‍රශස්තියේ එන කරුණුවලින් අනාවරණය කරගත හැකි ය. එහි එන විස්තරවලින් ප්‍රකට වනුයේ ඔහු කලාවට ප්‍රිය කළ එයට අනුග්‍රහය දක් වූ චරිතයක් ලෙසිනි. ඔහුට එම ලිපියේ දී 'කවිරාජ' යන නාමය භාවිත කර තිබේ. ලිපියේ එන විස්තරයට අනුව ඔහු දක්‍ෂ කවියෙකි. ''ඔහු අන් කවීන්ට ආදර්ශයක් විය. ඔහුගේ කවීත්වය හා බුද්ධිමත් භාවය නිසා කවිමාන්‍ය හා පණ්ඩිතමාන්‍ය පුද්ගලයන්ට සැලකිලි දක්වීය. එපමණක් නොව ඔහු ධර්මයට බඳනා ලද පවුරක් හා සමාන විය. චන්ද්‍ර රශ්මියට සමාන සේ පැතුරණු කීර්තියක් ඔහුට තිබුණේය.''[8] සමුද්‍ර ගුප්ත කවියෙක් මෙන් ම බුද්ධිමත් චරිතයකි. එනිසා ම ඔහු ධර්මය ආරක්‍ෂා කරන ප්‍රාකාරයක් හා සමාන විය. ඔහුගේ කීර්තිය චන්ද්‍ර රශ්මියට උපමා කිරීමෙන් ඔහුගේ කීර්තියේ නොකැළැල් බවත් ඔහුගේ සෞම්‍යත්වයත් සොඳුරු බවත් යන දෙයංශය ම පිළිබිඹු කරයි. මෙම විස්තරයන්ගෙන් පැහැදිලි වනුයේ ඔහු කලාකෘති රචනා

කරන ලේඛකයන්ට උදව් උපකාර කළ කලාකාමි ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව ය. මෙතෙක් ලොව පහළ වූ ලෝකයේ කවර පාලකයෙකුවත් සිය කාසිවල ලේඛනයන් ඡන්දසින් බැඳ නැත. කාසිවල පද්‍ය පාඨ ඡන්දසින් බඳින ලද්දේ සමුද්‍ර ගුප්ත පමණි. එයින් පැහැදිලි වනුයේ සැබැවින් ම ඔහු 'කවිරාජ' පදවිය දැරීමට සුදුස්සෙකු වූ බව ය.

## සමුද්‍ර ගුප්තගේ දිග් විජය ව්‍යාපාරය හා අලහබාද් ප්‍රශස්තිය

දිග් විජය ප්‍රතිපත්තියක් තුළින් සිය රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා පුළුල් කළ පාලකයන් ලෝක ඉතිහාසය තුළ සිටිනුයේ අතලොස්සක් පමණි. ග්‍රීසියේ ඇලෙක්සැන්ඩර්, රෝමයේ ජුලියට් සීසර්, භාරත දේශයේ ධර්මාශෝක වැනි පාලකයන් ඒ අතුරින් ඉදිරියෙන් සිටී. ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා ඔසවා තැබුවේ සමුද්‍ර ගුප්ත අධිරාජයා ය. එබැවින් සමුද්‍ර ගුප්ත ද ඉහත සඳහන් කළ පාලකයන් හා සමගාමි වන පාලකයෙකු ලෙස හැඳින්වීමට ඇතැමුන් පෙළඹී සිටී. දරුණු සටන් ව්‍යාපාරයන්ගෙන් තොරව කිසිවෙකුටත් සිය රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා පුළුල් කළ නොහැකි ය. එබැවින් කිසියම් පාලකයෙක් අධිරාජ්‍යයක් ගොඩනැගීමට අපේක්ෂා කරන්නේ නම් අනිවාර්යයෙන් සිය සතුරු රාජ්‍යයන් සමඟ සටනට එළඹිය යුතු ය.[9] එම ක්‍රියාවලිය ඒ ආකාරයෙන් ම ක්‍රියාවට නැංවූ සමුද්‍ර ගුප්ත සටන් ආවලියක් තුළින් සිය රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා ඔසවා තැබීමට ක්‍රියා කළේ ය. ඔහුගේ එම සටන් ව්‍යාපාරයත් ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා වර්ධනය වූ ආකාරයත් පිළිබිඹු කරන වැදගත් ම මූලාශ්‍රය වනුයේ අලහබාද් ප්‍රශස්තියයි. එම මූලාශ්‍රය ඇසුරෙන් සමුද්‍ර ගුප්තගේ දිග් විජය ප්‍රතිපත්තියත් ගුප්ත අධිරාජ්‍යයේ වර්ධනයත් විමර්ශනයට ලක් කෙරේ.

ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා ඔසවා තැබූ පාලකයන් අතර පුරෝගාමියෙකු වන සමුද්‍ර ගුප්ත සිය අධිරාජ්‍යය ගොඩනැගුවේ බාහු බලයෙනි. එනිසා ඔහුගේ රාජ්‍ය කාලයෙන් වැඩි හරියක් ගත වූයේ සතුරන් හා සටන් වැදීමට ය. ඔහු සටන්වලට දක්ෂයෙක් විය. එබැවින් ''අවශ්‍ය කරුණු සම්පූර්ණ නම් තමාගේ සතුරාට විරුද්ධව සටනට යා යුතුය.'' යනුවෙන් කෞටිල්‍ය දී ඇති අවවාදය සමුද්‍ර ගුප්ත අකුරට ම ක්‍රියාත්මක කළේ ය. ඔහුට ඉන්දියාවේ නැපෝලියන් යනුවෙන් ස්මිත්

මහතා ව්‍යවහාර කරනුයේ ද මේ කරුණු නිසා ය. නමුත් සබැවින් ම ඔහු නැපෝලියන් කෙනෙක් වූයේ ද යන්න විමසිය යුතු ය. සමුද්‍ර ගුප්ත හා නැපෝලියන් අතර බොහෝ වෙනස් කම් ඇති බැවින් ඇතැමුන් මේ දෙදෙනාගේ සංසන්දනයට එතරම් කැමැත්තක් දක්වන්නේ නැත. ඇතැමුන්ගේ අදහස වන්නේ සමුද්‍ර ගුප්ත නැපෝලියන්ට වඩා ඉදිරියෙන් සිටින බව ය.[10] ස්වකීය ජීවිතයේ අවසන් මොහොතේ දී පළමු චන්ද්‍රගුප්ත සමුද්‍රගුප්තට ප්‍රකාශ කළේ 'මේ පෘථිවිය ආරක්‍ෂා කරපන්' යනුවෙනි. සමස්ත පෘථිවිය ම හෙවත් මුළු ඉන්දියාව ම (ඔවුන් ඉන්දියාව දුටුවේ ලෝකය යනුවෙනි.) යටත් කර ගැනීමට තැත් කිරීම තුළින් ඔහු එය ක්‍රියාවට නැංවීමට උත්සාහ කළ බව අලහබාද් ප්‍රශස්තිය තුළින් ප්‍රකට වේ. ප්‍රශස්තියේදී සමුද්‍ර ගුප්ත හඳුන්වා ඇත්තේ 'සටන් සියයක වීරයා' යනුවෙනි. එසේ හඳුන්වා ඇත්තේ එතරම් ඔහු සටන්වල නියැලී සිටි නිසාවෙනි.

ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා පුළුල් කළ ගුප්ත පාලකයන් අතුරින් සමුද්‍ර ගුප්තයන්ට හිමි වනුයේ සුවිශේෂිත ස්ථානයකි. ඉදින් ගුප්තයන්ගේ කුඩා රාජ්‍යය අධිරාජ්‍යයක තත්ත්වයෙන් වර්ධනය කිරීම පිළිබඳ කිසිවෙකුට ගෞරවයක් ලැබේ නම් එය සමුද්‍ර ගුප්තගේ බාහුවලට හිමි විය යුතුව පවතී. සමුද්‍ර ගුප්ත සැතපුම් දහස් ගණනක් තෙක් කරන ලද දිග් විජය ම ඔහුගේ අද්භූත වූ වීරත්වයත්, අතුල පරාක්‍රමයත් පෙන්වන උදාහරණයි. 'ඔහු සිය ගණන් සටන් කළේය. ඔහුගේ දේහයෙහි කොතෙකුත් තුවාල (කැළල්) ඇති වීම ඔහුගේ යුද ප්‍රියතාව පෙන්වන සාධක වේ.'[11] යන විස්තරයෙන් ඔහු ගුප්ත රාජ්‍යය, අධිරාජ්‍යයක් කරා රැගෙන ගිය ආකාරයත්, ඔහු යුද්ධයට කොතරම් දක්‍ෂ ද, ඔහුගේ ශූරත්වය කෙබඳු ද යන්නත්, ඔහු යුද කාර්යට කොතරම් ඇලුම් කළේද යන්නත් මැනවින් හඳුනාගත හැකිය.

"තසය විවිධ - සමර - ශතාවතසෘන - දක්‍ෂසය සවභුජ - බල - පරාක්‍රමෛකබන්ධොඃ පරාක්‍රමාඞකසය පරශු - ශර - ශඞකු - ශකති - ප්‍රායාසි - තොමර - භින්දිපාල - න(ා)රාච - වෛතසතිකාiනෙක - ප්‍රහරණ - විරූඪාකුල - ව්‍රණ ශතාඞක - ශොභා - සමුදයො - පචිත - කානතතර - වෂර්මණඃ.[12] යන පාඨයෙන් සමුද්‍රගුප්තයන්ගේ රණ ශූරත්වය වර්ණනා කර තිබේ. සමුද්‍ර ගුප්ත සිය බාහු බලය යොදාගෙන පර සතුරන් මර්දනය කළ ආකාරය එයින් නිරූපිත ය. එම යුද ව්‍යාපාරයේදී පොරෝ,

දුණු, කඩු, තෝමර වැනි අවි ආයුධ භාවිත කළ බවත් එම ආයුධ භාවිත කරමින් කරන ලද සටන් මුහුණට මුහුණලා කරන ලද සටන් ව්‍යාපාර බවත් මෙයින් තහවුරු වේ. සමුද්‍ර ගුප්ත කෙතරම් යුද වැදී ඇත්ද යන්න ඔහුගේ ශරීරය ම නිදසුන් සපයයි. ඔහුගේ ශරීරය සිය ගණන් කැළැල්වලින් සමන්විත ය. එයින් ඔහුගේ ශරීරයට කිසියම් ලස්සන බවක් ගෙන දෙන්නේ යැයි ලිපියෙන් කියැවේ. සැබවින් ම කැළැල්වලින් ශරීරයට ලස්සනක් ලබා දෙන්නේ නැත. ශරීරය පුරා ඇති කැළැල්වලින් ලස්සනට වඩා ඔහුගේ යුද කාමීත්වය නිරූපිතය. ඔහු යුද කටයුතුවලදී දක් වූ මෙම වීරත්වය ඔහු විසින් නිකුත් කළ කාසිවලින් ද නිරූපනය වී තිබේ.

සමුද්‍ර ගුප්තගේ චරිතයට වැඩි ආලෝකයක් ප්‍රශස්තිය තුළින් ලබා දෙනුයේ ඔහුගේ යුද ව්‍යාපාරයන් හා සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කිරීමේදී ය. ඔහු ඉන්දීය දේශපාලන ඉතිහාසය තුළ සිය නම සනිටුවහන් කරගනු ලබන්නේ දිග් විජය ප්‍රතිපත්තිය තුළිණි. ඔහුගේ දිග් විජය ව්‍යාපාරය අලහබාද් ප්‍රශස්තියේ එන ආකාරයට ප්‍රදේශ අනුව කොටස් හතරකට බෙදිය හැකි ය.

- ගංගා මිටියාවතට එල්ල කළ යුද ව්‍යාපාරය. (ආර්යාවර්තය)
- කඳුකර ගෝත්‍රික අධිපතියනට විරුද්ධව කළ යුද ව්‍යාපාරය.
- දකුණේ රජවරුන් දොළොස් දෙනෙකුට විරුද්ධව ගෙන ගිය යුද ව්‍යාපාරය.
- ප්‍රත්‍යන්ත හා ගෝත්‍රික රාජ්‍යයන්ට විරුද්ධව කළ සටන් ව්‍යාපාරය යනුවෙනි.

මෙම ප්‍රශස්තියට අනුව සමුද්‍ර ගුප්ත විසින් ආර්යාවර්තයේ (දිල්ලිය අවට ප්‍රදේශ) රජුන් නව දෙනෙකු හා දක්ෂිණාපතයේ (දකුණු ප්‍රදේශයේ) නරේශ්වරයන් දෙළොස් දෙනෙකු පරාජය කරන ලද බවත්, එසේ ම මධ්‍ය ඉන්දියාවේ සියලු ම (අටවික - කැලෑ) රජවරුන් සිය සේවකයන් බවට පත් කළ බවත්, සීමා ප්‍රදේශ පාලකයන් හා සමුහාණ්ඩු පාලකයන්ට සමුද්‍ර ගුප්ත විසින් අය බදු ගෙවන ලෙස නියම කළ බවත් සඳහන් වේ.[13] මෙම ජයග්‍රහණ පදනම් කරගෙන සමුද්‍ර ගුප්තගේ බලය හා කීර්තිය කෙතෙක් දුරට පැතිරුයේද

කිවහොත් සිය දේශයෙන් ඉතා ඈත ප්‍රදේශවල රජුන් වන සිංහල දේශයේ හා කාශ්මීරයේ කුෂාණ රජවරු පවා ඔහු සමඟ මිත්‍රත්වයෙන් කටයුතු කිරීමට පෙළඹුණි. මේ ආකාරයට ඉතා විශාල අධිරාජ්‍යයක් සමුද්‍ර ගුප්ත විසින් පිහිට වූ බව අලහබාද් ප්‍රශස්තියෙන් හෙළි දරවු වේ. විශේෂයෙන් මෙහිදී සමුද්‍ර ගුප්ත අනෙකුත් රාජ්‍යයන් කෙරෙහි අනුගමනය කරන ලද පිළිවෙත තුන් ආකාරයකින් විස්තර කළ හැකිය. ඔහුගේ දිග් විජය ප්‍රතිපත්තිය 'ග්‍රහණ, මෝක්ෂ, අනුග්‍රහ' වශයෙන් ත්‍රිවිධ විය. 'ග්‍රහණ' යනු රාජ්‍යයන් යටත් කර ගැනීමයි. 'මෝක්ෂ' යනු යටත් කොට නිදහස් කිරීමයි. 'අනුග්‍රහ' යනු යටත් වූ පාලකයාට හිමි තැන නැවත ලබා දීමයි. ඔහුගේ අණසක පිළිගත්, යටත් වූ, සබඳතා ගොඩ නගා ගැනීමට උත්සුක වූ පාලක නාමයන් සමඟ රාජ්‍ය නාමයන් ද ප්‍රශස්තිය තුළින් නිරූපිත ය.

### ගංගා මිටියාවතට එල්ල කළ යුද ව්‍යාපාරය (ආර්යාවර්තය)

යුද්ධයේ දී උපායශීලීව කටයුතු කළ සමුද්‍ර ගුප්ත ප්‍රථමයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තිය වූයේ සිය අග නුවර වටා පිහිටි රාජ්‍යවලට පහර දී ඒවායේ රජවරුන් විනාශ කිරීමයි. එම යුද ක්‍රියාවලිය අතිශයින් වැදගත් යුද්ධෝපක්‍රමයකි. ඔහු අසල්වැසි රාජ්‍යයන් කෙරෙහි සහනශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවක් පෙනෙන්නට නැත. කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ ඉගැන්වෙන 'මණ්ඩල න්‍යාය' තුළින් ප්‍රකාශිත විජිගීසු (අධිරාජ්‍යයක් ගොඩනගා ගැනීමට කැමති පාලකයා) නම් පාලකයා සිය අසල්වැසි රාජ්‍යය නිරතුරුව දකින්නේ සතුරු රාජ්‍යයක් ලෙසිනි. සිය සතුරු රාජ්‍යය තමන්ට වඩා යුදමය අතින් බලවත් නම් කිසි සේත් එම රාජ්‍යය සමඟ යුද්ධයකට අවතීර්ණ නොවිය යුතු ය. එසේම සිය අසල්වැසි සතුරු රාජ්‍යය යුදමය අතින් තම රාජ්‍යය හා සමාන වන්නේ නම් යුද්ධමය ක්‍රියාවලියකට අවතීර්ණ නොවිය යුතු ය. යමෙක් මෙම අවස්ථා දෙකේ දී යුද වදින්නේ ද එයින් දුර්වලයාටත් සම බල ඇත්තන්ටත් තදබල හානි ගෙන දෙයි. එසේ හෙයින් යුද්ධයකට අවතීර්ණ විය යුත්තේ සිය සතුරා දුර්වල නම් පමණි. සතුරු රාජ්‍යය දුර්වල වූ විගස ම එයට පහර දිය යුතු ය. එවිට පහසුවෙන් එම රාජ්‍යයන් අල්ලා ගත හැකිය. ඒ බව කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ එන තොරතුරුවලින් ද තහවුරු වේ.[13] ඔහුගේ සටන් ව්‍යාපාර ක්‍රියාත්මක වූ ආකාරයෙන් පැහැදිලි වනුයේ මෙම ඉගැන්වීම් ඔහුට ආදර්ශයක් සපයන්නට ඇති බව ය.

''රුද්‍රදේව - මතිල - නාගදතත - චන්‍ද්‍රවමමී - ගණපතිනාග - නාගසෙනාච්‍යුත - නන්‍දි - බලවමමීාද්‍යනෙකාය්‍යාාවතතරාජ - ප්‍රසභොද්ධරණොදවෘතත - ප්‍රභාව - මහතඃ පරිචාරකීකෘත - සවවීාටවික - රාජස්‍ය''[14] යනුවෙන් ආර්යවර්ත යුද ව්‍යාපාරයේදී ඔහු විසින් විනාශ කළ රජවරුන්ගේ නම් ගණනාවක් සඳහන් කොට තිබේ. එසේ විනාශ කළ පාලකයන් අතුරෙන් හඳුනාගෙන අත්තේ නව දෙනෙකු පමණි. මෙම යුද ව්‍යාපාරයේදී සමුද්‍ර ගුප්ත ප්‍රථමයෙන් පහර දෙනු ලැබුවේ 'අහිච්ඡත්‍රයේ' (වර්තමානයේ රෝහිල්ඛාන්ද් ප්‍රදේශය) 'අච්‍යුතට' හා 'පද්මාවති' රාජ්‍යයේ (වර්තමානයේ මධ්‍ය ඉන්දියාවේ) 'නාගසේනට ය.' සමුද්‍ර ගුප්තගේ ආක්‍රමණයට ලක් වූ ඊළඟ පාලකයා වන්නේ නූතන මධ්‍ය ඉන්දියාවේ 'නාර්වාර් සහ බේස් නගර' යන ප්‍රදේශවල රජ කළ 'ගණපති නාගයි.' මෙම පාලකයන් සමුද්‍ර ගුප්තගේ ආක්‍රමණයට ඍජුව ම ලක් වූ බව ට හඳුනාගත හැකි ය. 'මතිල' නම් පාලකයා රාජ්‍යය විචාළේ වර්තමාන 'බුලන්ද්ෂාර්' දිස්ත්‍රික්කයේ යැයි විශ්වාස කරන අතර 'චන්ද්‍රවර්මන්' බටහිර බෙංගාලයේ 'පුෂ්කරණ' රාජ්‍යයේ පාලකයා වූ බව ඇතමුන්ගේ අදහස වී තිබේ. ලිපියේ සඳහන් අනෙක් පාලකයන් පාලනය කළේ කවර ප්‍රදේශද යන්න නිශ්චිතව හඳුනාගැනීමට අපහසු වී තිබේ. ටැම් ලිපියේ සඳහන් විස්තරවලින් පැහැදිලි වනුයේ ආර්යාවර්ත යුද පෙරමුණේදී ඉහත නම් සඳහන් 'මතිල' සිට 'නන්දි බලවර්ම' දක්වා වූ පාලකයන් සමුද්‍ර ගුප්ත අතින් පරාජයට පත් වූ බව ය. සිය සමීප රාජ්‍යයන් ඒ ආකාරයෙන් පරාජයට පත්කිරීම ඔහුගේ රාජ්‍යය අධිරාජ්‍යයක් දක්වා ඔසවා තැබීමේ ව්‍යාපාරයට බෙහෙවින් වැදගත් වුණි. එතුළින් ඔහුගේ කීර්ති ඝෝෂාව හා බල පරාක්‍රමය ඉන්දියාව පුරා පැතිරෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය. ප්‍රශස්තියෙහි 'ආදි අනෙක ආර්යාවර්ත' යන්න යෙදීමෙන් සමුද්‍ර ගුප්ත රජු විසින් ආර්යාවර්තයේ අනෙකුත් රජවරුන් ද රාජ්‍යයෙන් බැහැර කර තිබේ. ආර්යාවර්ත යුද ව්‍යාපාරයේදී ඉහත නම් සඳහන් පාලකයන්ට අමතරව තවත් පාලකයන් කිහිප දෙනෙකු සමුද්‍ර ගුප්ත විසින් පරාජය කරන ලදැයි පෙනෙන නමුත් එම පාලකයන් කවුරුන්ද යන්න හඳුනාගැනීමට නොහැකි වී තිබේ. ආර්යාවර්ත යුද ව්‍යාපාරයේදී සමුද්‍ර ගුප්ත අතින් පරාජයට පත් වූ පාලකයන් ගණන නව දෙනෙකි. මෙම රජුන් නව දෙනා විෂ්ණු පුරාණයේ සඳහන් වන 'නව නාග' නරේශ්වරයන් බවට 'රැප්සන්'

අනුමාන කරයි. නාගවංශික නරේශ්වරයන් විසින් එක්සත් රාජ්‍යයක් පිහිටුවන ලද බවත් සමුද්‍ර ගුප්ත එය විනාශ කර එම ප්‍රදේශ සිය අධිරාජ්‍යයට එකතු කළ බවත් මෙයින් ගම්‍ය වේ. නමුත් මෙම මතය ඒ ආකාරයෙන් ම සත්‍ය දැයි සනාථ කරන වෙනත් කිසිඳු සාධකයක් තවමත් ලැබී නැත. ලිපියේ නම් වශයෙන් සඳහන් වෙන මෙම රජුන් නව දෙනා භින්න භින්න (වෙනත් වෙනත්) ස්ථානයන්හී පාලකයන් වූ බව නම් සත්‍යයකි.

ඔහු මුලින් ම උතුරු ඉන්දියාව තුළ සුළු යුද්ධයක් කළ බවත්, ඉන් අනතුරුව දක්ෂිණ දේශයට ආක්‍රමණ එල්ල කළ බවත් ලිපියෙන් තහවුරු වේ. දක්ෂිණ දේශයට කළ යුද ව්‍යාපාරයෙන් පසුව ඔහු නැවතත් උතුරු ඉන්දියාව තුළ විශාල යුද ව්‍යාපාරයක් ගෙන ගිය බව සඳහන් ය. වයඹ දිග ඉන්දියාවේ 'මාල්වා' හා නැගෙනහිර 'පංජාබය' පමණක් නොව, එම යුද ව්‍යාපාරයේ දී 'වාකාටක' රජු වූ රුද්‍රසේනයන් ද මරා දැමූ බව ජයස්වාල්ගේ අදහසයි.[16] අධිරාජ්‍යයේ විශාලත්වය පිළිබඳව අවධානය යොමු කරන විට මෙහි කිසියම් අවිශ්වාසයක් පවතින බවක් ද පෙනී යයි. සමුද්‍ර ගුප්ත විසින් පරාජයට පත් කරන ලදැයි කියවෙන මෙම ප්‍රදේශයන් නැවත වතාවක් ඔහු පුත් දෙවන චන්ද්‍ර ගුප්ත විසින් ද පරාජයට පත් කළ බව කීමෙන් එය තව දුරටත් සැකයට බඳුන් වෙයි. සමුද්‍ර ගුප්තගේ අභාවයෙන් පසුව ඔහු විසින් යටත් කරගත් රාජ්‍යයන් ස්වාධීන රාජයයන් බවට පත් වූවා ද එසේත් නොමැති නම් ඉහත සඳහන් කළ ආකාරයේ යටත් වීමක් සිදු නොවූවේද යන්න ඍජුව ප්‍රකාශ කළ නොහැකි තත්ත්වයක් මෙයින් උද්ගත වී තිබේ.

**කඳුකර ගෝත්‍රික අධිපතියනට විරුද්ධව කළ යුද ව්‍යාපාරය**

උතුරු ඉන්දියාවේ ආර්යාවර්තය ජයග්‍රහණය කිරීමෙන් පසුව සමුද්‍ර ගුප්තගේ අද්විතීය යුද ව්‍යාපාරය වූයේ 'අටවික' රාජ්‍යයන්හී රජවරු යටත්කර ගැනීම ය. අටවික රාජ්‍යය යන්නෙන් අදහස් කරන්නට ඇත්තේ වින්ධ්‍යා කඳු වැටිය අවට ප්‍රදේශ බවට සැකයක් නැත. මෙම අටවික රාජ්‍යයන් වෙත මුදාහළ ඔහුගේ යුද ව්‍යාපාරය වෙන ම යුද ව්‍යාපාරයක් නොව, ඔහු විසින් දක්ෂිණ දේශයට විරුද්ධ ගෙන ගිය යුද ව්‍යාපාරයේ මුල් කොටස ලෙස සැලකිය යුතු ය.

මන්දයත් දක්ෂිණ භාරතය ජය ගැනීමට නම් පළමුවෙන් අටවික රජවරුන් ජයග්‍රහණය කිරීම අනිවාර්ය කටයුත්තකි. එසේ නොකර ඔහුට දක්ෂිණ දේශය ආක්‍රමණය කළ නොහැකි ය. මේ නිසා දකුණු ඉන්දියානු රජවරුන් යටත් කරගැනීමට පෙර, අටවික රජවරුන් ජය ගැනීම සමුද්‍ර ගුප්තයන්ට අතිශයින් වැදගත් විය. අටවික (කැලෑබද) රජවරු සියලු දෙනා පරාජය කළ බව අලහබාද් ප්‍රශස්තියෙන් මෙන් ම සමුද්‍ර ගුප්තගේ 'ඒරණ' ප්‍රශස්තියෙන් ද තහවුරු වී තිබේ.[17] මේ අටවික රජවරු උත්තර ප්‍රදේශයේ 'හාජිපුර' පටන් මධ්‍ය ප්‍රදේශයේ 'ජබල්පූර්' (නූතන ඉන්දියාවේ) දක්වා ව්‍යාප්තව සිටි බව 'ෆිල්ට්' නම් ඉතිහාසඥයා විසින් සඳහන් කොට තිබේ. මේ කියනු ලබන ප්‍රදේශ 'බුන්දේල්බාන්ඩ්' පටන් 'ඔරිස්සාව' තෙක් පැතිර තිබූ බව පැහැදිලි ය. තම දිග් විජය ප්‍රතිපත්තිය උතුරට පමණක් සීමා නොකළ සමුද්‍ර ගුප්ත එය මධ්‍ය ඉන්දියාවේ ඩෙකානය දක්වා ද මෙහෙය වන ආකාරයක් හඳුනාගත හැකිය.

''කෞසලකමමහෙනද්‍ර - මහා (ා) කානතාරකව්‍යාඝ්‍රරාජ - කෛරාලකව්‍යාමණ්ටරාජ - පෛෂ්ටපුරක මහෙන්‍ද්‍රගිරි - කෞටටූරකසවාමිදතෛතරණ්ඩපලලකදමන - කාඤ්චෙයක විෂ්ණුගොපාවමුකතක නීලරාජ - වෛඩෙගයකහසතිවමමා පාලකක කොග්‍රසෙන - දෙවරාෂට්‍රකකුවෙර, කෞසථලපුරක ධනඤ්ජයප්‍රභෘති සර්ව දක්ෂිණාපථරාජග්‍රහණමොක්ෂානුග්‍රහජනිත ප්‍රාතපොන් මිශ්‍ර මහාභාග්‍යසය.''[18] ආදි වශයෙන් අටවික රාජ්‍යයන් වෙත මුදාහළ යුද ව්‍යාපාරයේදී පාලකයන් දොළොස් දෙනෙකු සමුද්‍ර ගුප්ත ඉදිරියේදී පරාජයට පත් වූ බව ප්‍රශස්තියේ සඳහන්ව තිබේ. 'කෝසළයේ මහෙන්ද්‍ර රජු (නූතන ඉන්දියාවේ ප්‍රාග් රායිපූර්, බිල්ස්පූර් හා සම්බල්පුර දිස්ත්‍රික්කය), මහා කාන්තාරයේ ව්‍යාඝ්‍රරාජ (නූතන ඉන්දියාවේ ඔරිස්සාවේ පෙජෝර් අසල වනගත ප්‍රදේශයක), කුණාලයේ මන්ත රජු (මණ්ට), පිෂ්ටපුරයෙහි මහෙන්ද්‍ර රජු (නූතන ඉන්දියාවේ ගෝදාවරී පිෂ්ට පුරය), කොට්ටුරයෙහි ස්වාමිදත්ත, ඒරණ්ඩපල්ලයෙහි දමන රජු (නූතන ඉන්දියාවේ විසාගපට්ටම් ප්‍රදේශය), කාංචියෙහි විෂ්ණුගෝප (පල්ලව රාජ්‍ය - නූතන ඉන්දියාවේ චිංගල්පුට් දිස්ත්‍රික්කයේ කෝෂේවරම්), අවමුක්තයෙහි නීල රාජ, වෙංගියෙහි හස්තිවර්මන්, පාලක්කයෙහි උග්‍රසේන (නූතන ඉන්දියාවේ නෙල්ලෝර් දිස්ත්‍රික්කය),

දේවරාෂ්ටයෙහි කුවේර රජු (නූතන ඉන්දියාවේ විසාගපට්ටම් ප්‍රදේශය), කුශ්යාලයෙහි ධනංජය' යනුවෙන් අලහබාද් ප්‍රශස්තියේ සඳහන් අටවික රජවරු කිහිප දෙනෙකු ජීවත් වූ ප්‍රදේශ මෙසේ හඳුනාගත හැකිය.

ප්‍රශස්තියෙහි දැක්වෙන ආකාරයට සමුද්‍ර ගුප්ත අතින් පරාජයට පත් වූ පළමු අටවික රාජ්‍යය වනුයේ දක්ෂිණ කෝසළයයි. දෙවැනි අටවික රාජ්‍යය මහා කාන්තාරයයි. එකල මහා කාන්තාරයෙහි පාලකයා වූ ව්‍යාඝ්‍රරාජ යනු 'උච්ඡ කල්ප' රාජවංශයට අයත් 'ජයනාථගේ පියා වූ 'ව්‍යාඝ්‍ර' බවත් ඔහු බුන්දෙල්ඛාන්ඩ් ප්‍රදේශයට අයත් 'ජසෝ' රාජ්‍යය පාලනය කළ බවත් බණ්ඩාර්කාර් මහතාගේ අදහසයි. ප්‍රශස්තියට අනුව මෙම රාජ්‍යය කෝසළයට සමීප ප්‍රදේශයක් වියයුතු ය. 'මහාවන' නමින් පැරණි සෙල්ලිපියක සඳහන් වන වර්තමාන 'ජෛර්පූර්' වනය 'මහා කාන්තාරය' නම් රාජ්‍යය විය හැකිය. මෙය පිහිටා ඇත්තේ වර්තමාන ඉන්දියාවේ ඔරිස්සා ප්‍රාන්තයේ ය. ඇතැමෙකු පෙන්වාදෙන ආකාරයට මෙම ප්‍රදේශය නැගෙනහිර ඩෙකෑන් ප්‍රදේශය විය හැකිය. මේ ආදි වශයෙන් මෙම ප්‍රදේශය සම්බන්ධව විවිධ මතවාද පවතී. ප්‍රශස්තියේ සඳහන් 'පිෂ්ටපුරයේ මහෙන්ද්‍රගිරි' යනු නූතන ඉන්දියාවේ ගෝදාවරි දිස්ත්‍රික්කයේ 'පිෂ්ටපුරම්' ප්‍රදේශයයි. 'කොට්ටූරය' යනු නූතන ඉන්දියාවේ ගංජම් දිස්ත්‍රික්කයේ 'කුටූර්' වශයෙන් හෝ 'විසාගපතම්' දිස්ත්‍රික්කයේ 'කොට්ටූරය' ලෙස හෝ හඳුනාගත හැකි ය. සමුද්‍ර ගුප්ත අධිරාජයා විසින් යටත් කරගත් අටවික රාජ්‍යයන් පිහිටි ප්‍රදේශ මේ ආකාරයෙන් හඳුනාගෙන ඇති මුත් ඇතැම් ප්‍රදේශ තවමත් හඳුනාගෙන නැත. (මෙහි ඇති බොහෝ ස්ථාන නාම නූතනයේ හඳුන්වනු ලබන නම් බව සැලකිය යුතු ය.)

**දකුණේ රජවරුන් දොළොස් දෙනෙකුට විරුද්ධව ගෙන ගිය යුද ව්‍යාපාරය**

සමුද්‍ර ගුප්ත උතුරු ඉන්දියාවට එල්ල කළ ආක්‍රමණයෙන් පසුව යමුනා නදීබඩ 'සංර්ව හා ජම්බුල්පූර්' ප්‍රදේශ හරහා ගොස් දකුණු කෝසළ දේශයට (අටවික රාජ්‍යය) පහර දී ඉනික්බිතිව කාංචිය තෙක් තම සටන දියත් කළේය. අලහබාද් ප්‍රශස්තියට අනුව ඔහුගේ දකුණු ඉන්දීය යුද ව්‍යාපාරය ධර්ම විජය ස්වරූපයක් ගෙන තිබේ. එම ආක්‍රමණය 'ග්‍රහණ, මෝක්ෂ සහ අනුග්‍රහ' යන ත්‍රිවිධාකාර ප්‍රතිපත්තියට

අනුව සිදු විය. මෙයින් අර්ථ ගැන්වෙන්නේ දකුණු ඉන්දීය රාජ්‍යයන් පරාජය කොට, අල්වාගෙන, නැවත එම රාජ්‍යයන් ඔවුන්ට ම දුන් බව ය. ස්වාධීන රජවරුන් මෙන් ම, ප්‍රාදේශීය පාලකයන් ද එම ත්‍රිවිධාකාර ප්‍රතිපත්තියට ඇතුළත් වූ බවට සැක කළ හැකි ය.

සමුද්‍ර ගුප්ත රජුගේ දකුණු ඉන්දීය යුද ව්‍යාපාරයේ මහා සටන සිදු වූයේ 'කොලයිර් විල' ආසන්නයේ දී ය. ප්‍රශස්තියේ සඳහන් ආකාරයට එම අවස්ථාවේ දකුණු ඉන්දියාවේ රජවරුන් පෙරමුණු දෙකක් වශයෙන් සංවිධානය වී සිටි බව පෙනේ. ඉන් එක් කණ්ඩායමක් කුරාලයෙහි 'මන්තරාජ' යටතේ ද අනෙක් කණ්ඩායම කාංචියේ 'විෂ්ණුගෝප' රජු යටතේ ද සංවිධානය විය. මෙයින් පැහැදිලි වනුයේ සිය පොදු සතුරාට එරෙහිව දකුණු ඉන්දීය පාලකයන් එක් පෙරමුණක සිටගත් බව ය. සතුරා තමන්ට වඩා බලවත් නම් අනිවාර්යයෙන් ඔහු සටනට පිවිසිය යුත්තේ සන්ධාන ගතවය. හුදකලාව සටනට පිවිසෙන යමෙක් වේ ද හේ බලවත් සතුරා වෙතින් ඉතා ඉක්මනින් විනාශයට පත් වේ. දකුණු ඉන්දීය සටන් බිමේ හුදකලා නොවූ මිතුරන් උපක්‍රමශීලීව පෙරමුණක් ලෙසින් සතුරාට විරුද්ධව යුද වැදුණි. එනිසා ම ඔවුන්ට සිය රාජ්‍යයන් බේරා ගැනීමට හැකිවුණි. එය ඉතා ම වැදගත් යුද උපක්‍රමයක් වූ බව කිව යුතු ය. මෙසේ පෙරමුණු ගතව යුද වැදීම ඉන්දීය දේශපාලන ඉතිහාසයේ සුවිශේෂිත අවස්ථාවක් ලෙසින් ද සැලකිය හැකි ය. මෙයින් පැහැදිලි වනුයේ සමුද්‍ර ගුප්තට දකුණු ඉන්දීය ප්‍රදේශ ආක්‍රමණය කිරීමට පහසු නොවූ බව ය.

### ආර්යාවර්තයට එල්ල කළ දෙවන ආක්‍රමණය

සමුද්‍ර ගුප්ත විසින් දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීමෙන් පසුව නැවතත් දෙවන වරට ආර්යාවර්තයට ආක්‍රමණයක් එල්ල කළ බව ප්‍රශස්තියේ සඳහන්ව තිබේ. ප්‍රශස්තිය කියන ආකාරයට සමුද්‍ර ගුප්ත මෙම ආක්‍රමණයේ දී රජවරුන් නව දෙනෙකු පරාජයට පත් කොට ඔවුන්ට අයත් රාජ්‍යයන් සියල්ල ම ඈඳාගත්තේ ය. දකුණු ඉන්දීය ආක්‍රමණයේ දී සමුද්‍ර ගුප්ත සිය ප්‍රතාපවත් බල මහිමය ප්‍රදර්ශනය කොට, අනතුරුව උතුරු ඉන්දියාවේ රජවරු විනාශ කිරීමට නැවතත් ඉදිරිපත් විය. පෙර සඳහන් කළ ආකාරයට උතුරු ඉන්දීය ආක්‍රමණයන්හීදී පරාජය කළ පාලකයන් නව දෙනා වනුයෙ 'රුද්‍ර

දේව, මිථිලා, චන්ද්‍රවර්මන්, ගණපතිනාග, නාගසේන, අච්‍යුත, නන්දින් හා බලවර්මන්' ය. ප්‍රථමයෙන් සිදු කළ උතුරු ඉන්දීය ආක්‍රමණයේදී ද 'නාගසේන සහ අච්‍යුත' විනාශ කළ බව දක්වුණි. මේ ආකාරයෙන් එම පාලකයන් පිළිබඳව දෙවනුව ද සඳහන් වන්නේ පරාජය කළ සියලු රජුන් දක්වීම සඳහාය යන්න ඇතැමුන්ගේ අදහසයි. ආර්යාවර්තයේදී පරාජයට පත් කරන ලද ඉහත කී රජුන් හැර ආර්යාවර්තයෙහි වූ අන්‍ය රජුන් ගැන ද යම් සඳහනක් ප්‍රශස්තියේ වේ. මේ අනුව පෙනී යනුයේ සමුද්‍ර ගුප්තයන් ආර්යාවර්තයේ (උතුරු ඉන්දියාවේ) විසූ සියලු ම රජුන් පරදවා එම ප්‍රදේශ එක්සේසත් කළ බවය.

## ප්‍රත්‍යන්ත හා ගෝත්‍රික රාජ්‍යයන්ට විරුද්ධව කළ සටන් ව්‍යාපාරය

ප්‍රත්‍යන්ත රාජ්‍ය පහක් හා ගෝත්‍රික රාජ්‍ය නවයක් සමුද්‍ර ගුප්ත රජුට අවනත වී බදු ගෙවීමටත්, ඔහුගේ අණසක පිළි පැදීමටත්, උපහාර දක්වීමටත් කැමති වූ බව ප්‍රශස්තියේ සඳහන් වේ. මෙම පරාජිත රජුන් අතර නොයෙකුත් ප්‍රදේශයන් පහක පාලකයන් වූ අතර ඔවුන් 'නෘපති' ශබ්දයෙන් හඳුන්වා ඇත. (පාලකයෙකු හැඳින්වීමට එම නම භාවිත කරයි.) මෙම රජුන් හැරෙන්නට තවත් රාජ්‍ය නවයක නම් දක්නට ලැබෙන අතර ඔවුන් ගණ රාජ්‍ය පාලකයන් වශයෙන් හඳුනාගත හැකිය. මෙම ගණ රාජ්‍යයන්හි පාලන ක්‍රමය පඤ්ච රාජ්‍යයන්ට සාපේක්ෂව වෙනස්ව පැවතුණි. එනිසා ඔවුන්ගේ නම් සමඟ 'නෘපති' ශබ්දය සඳහන් කර නොමැත. මෙම යාත්‍රාවේදී (සටන් ව්‍යාපාරයේදී) සමුද්‍ර ගුප්ත විසින් උතුරු හා නැගෙනහිර රජුන්ද බටහිර 'ගණ' රාජ්‍ය නවයක් ද සියතට ගන්නා ලද බව අලහබාද් ප්‍රශස්තියේ එන ''සමතට - ඩවාක - කාමරූප - නෙපාල - කතතෘ පුරාදි - ප්‍රත්‍යනත - නෘපතිභිමමාලවාර්ජුනායන - යෞධෙය - මාද්‍රකාභීර - ප්‍රාර්ජුන - සනකානීක - කාක - ඛරපරිකාදිභිශච සවර්‍ව - කරදානාඥාකරණා - ප්‍රණාමාගමන.[19]'' යන පාඨයෙන් තහවුරු වේ.

'සමතාත, දවාක, කාමරූප, නේපාල හා කත්‍රීපුර' යන රාජ්‍යයන් පහ සමුද්‍ර ගුප්තට අවනත බව ප්‍රකාශ කළ රාජ්‍යයන් ය. 'සමතාත' යනුවෙන් හඳුන්වන්නේ වර්තමාන ඉන්දියාව හා බංගලාදේශයට අයත් ගංගා හා බ්‍රහ්ම පුත්‍ර ඩෙල්ටා ප්‍රදේශයයි. 'දවාක' (උවාක) යනුවෙන් හැඳින්වෙන්නේ කුමන රාජ්‍යය ද යන්න තවමත්

නිශ්චිතව හඳුනාගෙන නැත. මෙම ප්‍රදේශය සම්බන්ධයෙන් විවිධ මතවාද පවතින අතර ඇතැමෙකු එය බෙංගාල ප්‍රදේශයේ රාජ්‍යයක් ලෙස ද ඇතැමෙකු එය ඇසෑමයේ 'කොපිලි' නදී නිම්නයේ පැවති රාජ්‍යයක් ලෙස ද, 'සමතට හා කාමරූප' රාජ්‍යයන්ට අතර මැදිව තිබූ රාජ්‍යයක් ලෙස ද හඳුන්වනු ලැබේ. 'කාමරූප' නමින් හැඳින්වෙන්නේ ඇසෑම් දේශයයි. 'නේපාලය' යනු ගොන්ඩැක් හා කෝසි නදී අතර ප්‍රදේශයයි. 'කත්‍රි පුරය' 'රෝහිල්බාන්ද්හී' 'කටුරිය' ඇතුළත් රාජ්‍යය හෝ 'මුල්තාන්' හා 'ලොහ්නි' අතර 'කරොර්' ප්‍රදේශය (පංජාබයේ ජාලංධර) හෝ විය හැකි බව ඉතිහාසඥයන්ගේ අදහසයි. මේ හැර 'මාලව, ආර්ජුනායන, යෞධේය, මද්‍රක, ආභීර, ප්‍රාර්ජුන, සනකානික, කාක හා ඛරපරික' යන ගෝත්‍රික රාජ්‍යයන් ද සමුද්‍ර ගුප්තගේ අධිපතිත්වය පිළිගත් බව ලිපියේ සඳහන්ව තිබේ. 'මාලව' යනු 'මෙවාර්හී' පිහිටි ඊසාන දිග්හී රාජ්‍යයකි. 'ආර්ජුනා' යනු බෘහත් සංහිතාවට අනුව උතුරු ඉන්දියාවේ පිහිටි රාජ්‍යයකි.[20] එය නූතන ඉන්දියාවේ 'අග්‍රාවට හා මථුරාවට' බටහිරින් පිහිටි රාජ්‍යයකි. වින්සන්ට් ස්මිත්ට අනුව එය නූතන 'භාරුත්පූර් හා අල්වාර්' ප්‍රදේශයයි. ඇලන් පඬිවරයාට අනුව එම ප්‍රදේශය 'දිල්ලි ජෛර්පූර් හා අග්‍රා' යන ත්‍රිකෝණ ප්‍රදේශයයි. 'යෞධේය' යනු 'මුල්තාන්' ප්‍රදේශයයි. 'මද්‍රක' යනු 'චේනාබ්' නදී අතර ප්‍රදේශයයි. 'ආභීර' යනු මහාභාරතයේ දැක්වෙන බටහිර 'රාජ්පුතානාවේ' 'සරස්වති හා විනාසන' අතර ප්‍රදේශය විය හැකිය. මොවුන් ඇතැම් විට ඇලෙක්සැන්ඩර් සමග ඉන්දියාවට පැමිණි විදේශීය ගෝත්‍රක කණ්ඩායම් ද විය හැකි බව ඇතැමුන්ගේ අදහස වී තිබේ. 'ප්‍රාර්ජුන' රාජ්‍යය පිහිටා තිබුණේ මධ්‍ය ප්‍රදේශයේ නරසිංහ පුරය අසල ය. 'සනකානික' යනු ග්වාලියොර්හී ඉසගාර දිස්ත්‍රික්කයයි. 'කාක' යනු සාංචිය අසල 'කාකගාද්' ප්‍රදේශය යැයි හඳුනාගෙන ඇති අතර 'ඛරපරික' යනු මධ්‍ය ප්‍රදේශයේ 'දබෝ' දිස්ත්‍රික්කය ලෙස හඳුනාගෙන ඇත. මේ ආකාරයෙන් ලිපියේ සඳහන් වෙන බොහෝ ප්‍රදේශ ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයට හා වයඹ දිග ඉන්දියානු ප්‍රදේශවලට ආසන්න ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි ය. මේ කරුණුවලින් පෙනී යනුයේ සමුද්‍ර ගුප්ත තම ආක්‍රමණ වයඹ දිග ඉන්දියාවේ දේශසීමා ආසන්නයට ම එල්ල කළ බවය. නමුත් එම ආක්‍රමණය සම්බන්ධයෙන් විවිධ මතවාද පවතී. සමුද්‍ර ගුප්තගේ පුත් දෙවන චන්ද්‍ර ගුප්ත විසින් ද ඉහත සඳහන් කළ ප්‍රදේශ ආක්‍රමණය

කළ බව ගුප්ත අවධියේ මූලාශ්‍රයෙන් පැහැදිලි වේ. සමුද්‍ර ගුප්ත මෙම ප්‍රදේශ ආක්‍රමණය කළේ නම් හා එම රාජ්‍යයන්හී පාලකයන් ඔහුගේ අධිපතිත්වය පිළිගත්තේ නම් නැවත දෙවන චන්ද්‍ර ගුප්ත එම ප්‍රදේශ ආක්‍රමණ කරන්නේ කුමක් සඳහා ද යන ප්‍රශ්නය මෙහිදී ඉස්මතු වේ. සමුද්‍ර ගුප්තගේ ආක්‍රමණයෙන් පසුව එම රාජ්‍යයන් නැවත ස්වාධීන වූයේ ද එසේත් නොමැති නම් සමුද්‍ර ගුප්ත නියමාකාරයෙන් එම ප්‍රදේශ යටත් නොකළේ ද යන්න ඉතිහාසඥයින් අතර ඇති ප්‍රශ්නයකි.

සමුද්‍ර ගුප්තට බටහිර ඉන්දියාවේ හා දකුණෙහි සේවය කළ ස්වාධීන රාජ්‍යයන් සමුද්‍ර ගුප්ත විසින් ප්‍රදේශ ආක්‍රමණයක් නොකළ ද ඔහුගේ අධිපතිත්වය පිළිගෙන ඔහුට යම් යම් සේවාවන් කිරීමට ඉදිරිපත් වූ පාලකයන් හා රාජ්‍යයන් ගණනාවක් පිළිබඳ විස්තර ප්‍රශස්තියෙන් අනාවරණය වේ. එම ස්වාධීන රාජ්‍යයන් විසින් කරන ලද සේවාවන් සිව් ආකාරයකට විස්තර කළ හැකි ය. එනම්

- ආත්ම නිවේදනය (රජුගේ සේවය පිණිස රටවැසියන් දීම)
- කාන්යෝපායන (කන්‍යාවන් එවීම)
- දාන (ත්‍යාග, භෝග දීම)

ගරුත්මදාංක ස්වවිෂය භුක්ති ශාසනයාචක (ඔවුන්ගේ දේශයන්හී ගරුඩ මුද්‍රාව පිළි ගැනීම)[21] යනුවෙන් එම සේවා සතරාකර වේ. මේ ආකාරයේ සේවා සැපයූ රාජ්‍යයන් වූයේ 'දෛව්‍ය පුත්‍ර, ශාහිශහානුශාහි, ශක, මුරුන්ද හා සිංහල' යන දේශයන් ය. මෙම රාජ්‍යයන් සමුද්‍ර ගුප්ත ඍජු ලෙස යටත් කරගත් රාජ්‍යයන් නොවේ. ඒවා ඔහු සමඟ හිත මිතුරුකම් ඇති කරගත් රාජ්‍යයන් ලෙස හැඳින්වීම වඩාත් උචිත ය.

''පරිතොෂිත - ප්‍රචණ්ඩ - ශාසනස්‍ය - අනෙක - භ්‍රෂටරාජෝත්‍යාතසනන - රාජවංශ - ප්‍රතිෂටාපනොද්භූත - නිඛිල - භු(ව)න - (විචරණා - ශා)නත - යශසඃ දෛවපුත්‍රෂාහිෂාහානුෂාහි - ශකමුරුණ්ඩෛඃ සෛංහලකාදිභිශ්ච.''[22] යන ප්‍රශස්ති පාඨයෙන් ප්‍රකාශිත 'දෛවපුත්‍ර ශාහිශහානුශාහි' යනු බටහිර පංජාබයේ හා කාශ්මීරයේ රජකළ කුෂාණ රජවරුන්ගේ රාජ්‍යය විය හැකි බව අතැමුන්ගේ විශ්වාසය වී තිබේ. 'ශකවරු' බටහිර ඉන්දියාවේ සාංචිය

ආසන්නයේ වාසය කළ අතර ඔවුන් දේශපාලන වශයෙන් ප්‍රබල තත්ත්වයක සිටි පිරිසකි. සමුද්‍ර ගුප්ත ඔවුන් ද තම වසඟයට ගත් බව අලහබාද් ප්‍රශස්තිය සඳහන් කරයි. නමුත් ඔහු පුත් දෙවන චන්ද්‍ර ගුප්ත විසින් ද මෙම ප්‍රදේශ යටත් කොට ගුප්ත අධිරාජ්‍යයට එක් කරන ලද බව ගුප්ත මූලාශ්‍රයේ සඳහන්ව තිබේ. ශක රාජ්‍යයේ අවනත භාවය පිළිබඳ මෙවැනි පරස්පරතාවයක් දක්නට ලැබේ. 'මුරුන්ද' යනුයෙන් ප්‍රශස්තියේ හැඳින්වෙන්නේ බටහිර ඉන්දියාවේ රජ කළ 'ශකසත්‍රපවරුන්ගේ' රාජ්‍යය විය හැකිය. සමුද්‍ර ගුප්ත රජුගේ අවධියේ දී දෙවන 'ක්‍ෂුද්‍රසිංහ' සත්‍රපයා එහි රජ කළේ යැයි හඳුනාගෙන තිබේ. 'සෛංහල' යන වචනය එම මිතුරු රාජ්‍යයනගේ අවසානයේ සඳහන් වන අතර එය ශ්‍රී ලංකාව ලෙස හඳුනාගෙන තිබේ.

බටහිර ඉන්දියාවේ රජ කළ ශක හා වයඹ දිග ඉන්දියාවේ සිටි කුෂාණ රජවරුන් ඇතැම් විට ගුප්ත අධිරාජ්‍යයේ බලය පිළිගන්නට ඇත. එහෙත් ඒ ගණයට ශ්‍රී ලංකාව එකතු කිරීම සැකයට තුඩු දෙන කරුණකි. වැන් - හ්‍යුං - සේ නම් චීන වාර්තා කරුවාට අනුව චී-මි-කිය - නෝමෝ (මේඝවර්ණාභය රජු) බුද්ධ ගයාවට වන්දනාවේ ගිය භික්‍ෂූන් වහන්සේලා දෙනමකට සිදු වූ අතවර (විශ්‍රාම ශාලාවක් නොවූ) නිසා සමුද්‍ර ගුප්ත රජුගෙන් බුද්ධ ගයාවෙහි ආරාමයක් තැනීමට අවසර ගෙන තිබේ. ශ්‍රී මේඝවර්ණාභය රජු කලාත්මක අතින් සම්පූර්ණ විශ්‍රාම ශාලාවක් එහි ඉදි කළ බවත්, එවැනි විශ්‍රාම ශාලාවක් ඉදි කිරීමට අවසර දීමේ සතුට නිමිති කරගෙන සිංහල රජු විවිධ ත්‍යාගයන් සමුද්‍ර ගුප්ත වෙත යැවූ බවත් එහි සඳහන් ය. ඉහත සඳහන් කළ විශ්‍රාම ශාලාව ඉදිකිරීම හා සම්බන්ධ තොරතුරු නිසා සිංහල රජු ද සමුද්‍ර ගුප්තගේ ආධිපත්‍යය පිළිගන්නට ඇතැයි ඇතැම්හු පෙන්වා දීමට උත්සාහ ගනිති. සිංහල රජු ත්‍යාග, භෝග යැවීම පදනම් කරගෙන මෙරට සමුද්‍ර ගුප්තයන්ට යටත් වූ රාජ්‍යක් වශයෙන් හෝ ඔහුගේ බලය පිළිගත් රාජ්‍යයක් වශයෙන් හෝ සැලකීම එතරම් උචිත නොවේ. එම කාරණය සනාථ කිරීමට වෙනත් කිසිඳු සාධකයන් නොමැති අතර ශ්‍රී මේඝවර්ණාභය රජු ස්වාධීන පාලකයෙකු ලෙසින් ශ්‍රී ලංකාව පාලනය කළ බව මෙරට මූලාශ්‍රයෙන් තහවුරු වේ.

''සවඞී - දවීප - වාසිභිරාතමනිවෙදන - කන්‍යොපායනදාන - ගරුත්මදඞකසව... ප්‍රිථිව්‍යාමප්‍රතිරථස්‍ය''[23] යන පාඨයට අනුව ඉහත

සඳහන් කළ ප්‍රදේශයන්ට අමතරව 'සර්ව ද්වීපවාසීනම්' යන වචනය ද ලේඛනයේ සඳහන් වෙයි. 'සර්ව ද්වීපවාසි' යනුවෙන් ප්‍රශස්තියේ දැක්වෙනුයේ 'මැලේ අර්ධ ද්වීපය' යැයි පෙන්වාදීමට ඇතමුන් උත්සාහ කරන අතර ඇතැමෙක් ජාවා, සුමාත්‍රා හා ඉන්දියානු ආර්චිපෙළගෝ දූපත් එනමින් හඳුන්වන බව කියති. සමුද්‍ර ගුප්ත රජු ප්‍රබල රජෙකු වූ නිසා මේ දිවයින් සමඟ ද සබඳකම් පවත් වන්නට ඇත. ගුප්ත යුගයේ දී අග්නිදිග ආසියාව හා ඉන්දියාව අතර සමීප සබඳකම් පැවති බව ෆාහියන් හිමියන්ගේ වාර්තාවෙන් ද තහවුරු වේ. මෙම ප්‍රදේශ පිළිබඳ සඳහනක් ප්‍රශස්තියේ ඇති නමුත් මේ ප්‍රදේශ ඔහුගේ යටත් ප්‍රදේශ වශයෙන් පැවතියේ යැයි සිතීමට නොහැකි ය.

මෙබඳු යුද්ධාවලියකින් පසුව සමුද්‍ර ගුප්ත අශ්වමේධ යාගයක් පැවැත් වූ බවට ඇතැම් මූලාශ්‍රයේ සඳහන් වෙතත් අලහබාද් ප්‍රශස්තියේ එම කාරණය සඳහන් වී නොමැත. මේ අනුව සමුද්‍ර ගුප්තගේ අධිරාජ්‍යය 'කාශ්මීරය, බටහිර පංජාබය, බටහිර රාජපුතානාව, සින්ධ් හා ගුජරාඨය හරුණු විට මුළු උතුරු ඉන්දියාව පුරා ම පැතිරෙන්නට ඇතැයි සැලකිය හැකි ය. අතැම් විට ඔහුගේ අනසක ඔරිස්සාව ඇතුළු 'විනගල්පුට්' ප්‍රදේශ හා නැගෙනහිර ඩෙකැනයේ වෙරළබඩ ප්‍රදේශ තෙක් ද පැතිර පැවති බව මෙයින් පැහැදිලි වේ.

## ප්‍රශස්තියෙන් අනාවරණය වන ගුප්ත රාජවංශය

ඉහත කියන ලද විස්තරකථනයන්ට අමතරව ගුප්ත රාජ වංශයේ සමාරම්භය හා රාජප්‍රාප්තියේ අනුපිළිවෙළ පිළිබඳව කිසියම් සඳහනක් ලිපියේ 28-29 යන පාඨවල සඳහන්ව තිබේ. එයින් ගුප්ත රාජවංශයේ ඉතිහාසයත් ගුප්ත රාජ්‍යයේ සමාරම්භයත් යන කරුණු දෙක ම අනාවරණය කරගත හැකිව තිබේ. "ශ්‍රී ගුප්ත මහ රජුගේ මී මුණු බුරු වූ ශ්‍රී ඝටෝත්කච මහ රජුගේ මුණුබුරු වූ ශ්‍රී චන්ද්‍ර ගුප්ත මහාධිරාජයන්ගේ පුත්‍ර වූ, ලිච්ඡවී දුහිතෘවගේ එනම් මහා දේවිය වූ 'කුමාර' දේවියගෙන් උපන් ශ්‍රී සමුද්‍ර ගුප්ත මහාධිරාජයා."[25] යනුවෙන් ප්‍රශස්තියේ ගුප්ත රාජවංශයේ පරම්පරාව පිළිබඳ සඳහනක් වේ. ප්‍රශස්තියේ එන විස්තරයට අනුව ශ්‍රී ගුප්ත මහ රජු යනු ගුප්ත රාජවංශයේ ආරම්භක පාලකයා ය. ශ්‍රී ගුප්තගෙන් පසුව රාජ්‍යයට පත්ව ඇත්තේ ශ්‍රී ඝටෝත්කච මහ රජු ය. ඔහුගේ අනුප්‍රාප්තිකයා

සමුද්‍ර ගුප්ත අධිරාජයාගේ පියාණන් වන පළමු චන්ද්‍ර ගුප්ත මහ රජු ය. පළමු චන්ද්‍ර ගුප්තගේ අග බිසව වනුයේ ලිච්ඡවී රාජවංශයට අයත් 'කුමාර' මහා දේවියයි. ඇයට 'මහා දේවිය' යන නාමය මෙන් ම 'කුමාර' දේවිය යන නම ද ව්‍යවහර කළ බව පෙනේ. ඔවුන් දෙදෙනාට උපන් කුමාරයා සමුද්‍ර ගුප්තයි. ඔහු පළමු චන්ද්‍ර ගුප්තගෙන් පසුව ගුප්ත රාජවංශයේ පාලකයා බවට පත් විය. අලහබාද් ප්‍රශස්තියේ එන මෙම විස්තරය ගුප්ත ඉතිහාසය අධ්‍යයනය කිරීමට මහත් පිටිවහලක් සපයයි. ගුප්ත රාජවංශයේ අනුක්‍රමික බව, රාජ්‍යයෙහි උරුම බව, පාලක අනුප්‍රාප්තිය වැනි වැදගත් කරුණු රැසක් එයින් අනාවරණය කරගත හැකිය.

### අලහබාද් ප්‍රශස්තියේ එන තොරතුරුවල සත්‍ය අසත්‍යතාවය

අලහබාද් ටැම් ලිපිය යනු ප්‍රශස්ති ස්වරූපයෙන් රචිත ලිපියක් වන හෙයින් එහි එන කරුණු සුපරීක්ෂාකාරීව විමසුමට ලක්කළ යුතුය. ප්‍රශස්ති කාව්‍යයක් තුළ අතිශයෝක්තියට නැඹුරු වූ තොරතුරු බෙහෙවින් තිබිය හැකිය. සාමාන්‍යයෙන් එබඳු ලේඛනයකින් එවැනි දෑ බලාපොරොත්තු විය යුතු ය. ඒ අනුව අලහබාද් ප්‍රශස්තියේ දක්වෙන තොරතුරු කෙතෙක් දුරට විශ්වසනීයත්වයෙන් යුතු ද යන්න විමසා බැලේ. ලිපියේ එන ඇතැම් තොරතුරු සැකයට භාජනය වී තිබේ. එම සැකය වඩාත් ඉස්මතු වන අවස්ථාව වනුයේ සමුද්‍ර ගුප්ත උතුරු ඉන්දියාවට ආක්‍රමණ දෙකක් එල්ල කරන ලදැයි කරන ලද සඳහනයි. ආර්යාවර්තයට ප්‍රථමයෙන් එල්ල කළ යුද්ධයේදී ඔහු විසින් විනාශ කළ 'අච්‍යුත, නාගසේන' වැනි රජවරු ආර්යාවර්තයට එල්ල කළ දෙවැනි ආක්‍රමණයේදී ද පැරද වූ බව ප්‍රශස්තියේ දැක් වේ. මේ ආකාරයෙන් පළමුව පරාජයට පත් කළ පාලක නාමයන් දෙවන වරදී ද පරාජය කළේ යැයි සඳහන් කර ඇත්තේ පරාජයට පත් කළ රජවරුන්ගේ සම්පූර්ණ නාම ලේඛනය සඳහන් කිරීමට යාමේදී ද එසේත් නොමැති නම් සමුද්‍ර ගුප්තගේ බල පරාක්‍රමය ඉහළින් ඔසවා තැබීමට උත්සාහ කිරීමෙන් ද යන්න සිතාගත නොහැකි ය.

නාණක මූලාශ්‍රයට අනුව සමුද්‍ර ගුප්ත විසින් නිකුත් කර ඇති කාසි වර්ග හයකින් තුන් වර්ගයක ම ඔහු නිරූපණය කර ඇත්තේ

රණ ශූරයෙකු ලෙස ය. එක් කාසියක වමතින් දුන්න ද දකුණතින් හීය ද රැගෙන සිටින අයුරු නිරූපිත ය. මෙම කාසිවල ''පෘථිවිය ජයගත් රාජාධිරාජ යහපත් ක්‍රියා මාර්ගයක් මගින් ස්වර්ගය ජය ගනි'' යන පාඨය සඳහන් වෙයි. තවත් කාසියක කෙටේරියක් අතින් ගත් රජුගේ රූපය දැක්වෙන අතර තවත් කාසියක ව්‍යාඝ්‍රයෙකු පාගාගෙන උගට විදින ආකාරයක් නිරූපණය වේ. මෙබඳු මූලාශ්‍රයෙන් ද පෙන්නුම් කරනුයේ සමුද්‍ර ගුප්ත රණ ශූරයෙකු බව ය. ඔහුගේ රණ ශූරත්වය පිළිබඳව නම් සැකයක් නැතිමුත් සැබැවින් ම ඔහු විසින් ඉහත සඳහන් කළ සියලු ප්‍රදේශ අල්ලා ගත්තේ ද එසේත් නොමැති නම් යටත් කර ගත්තේ ද යන්න නම් සැකයක් උපදී. ප්‍රශස්තියේ සඳහන් කර ඇති පරිදි ඔහු විසින් විශාල අධිරාජ්‍යයක් ගොඩ නැගුවේද යන්න සැක සහිත ය. තහවුරු කරගෙන තිබෙන වෙනත් මූලාශ්‍රය තොරතුරුවලට අනුව නම් ඔහු ඩෙකෑන් ප්‍රදේශයේ මධ්‍ය භාගය තෙක් වත් සිය බලය ව්‍යාප්ත නොකළේ ය. සමුද්‍ර ගුප්ත අධිරාජයාට සිය දිග් විජය ප්‍රතිපත්තිය මගින් සිය අධිරාජ්‍යය හිමාලයේ සිට කන්‍යාකුමරි තුඩුව තෙක් සමස්ත ඉන්දියාවේ ම ව්‍යාප්ත කිරීමට අවකාශ තිබුණු නමුත් එකල තිබුණු දේශපාලන වාතාවරණය හා භූගෝලීය සාධක මත එවැනි අධිරාජ්‍යයක් ගොඩ නැගීමට මෙන් ම පාලනය කිරීමට දුෂ්කර වූ බව පෙනෙයි.

පාලන සංයුතිය හා සංවිධානය අතින් ගත් කල ගුප්ත අධිරාජ්‍යය මෞර්ය අධිරාජ්‍යයට වඩා වෙනස් ය. මෞර්යය අධිරාජ්‍යය පාලනය කළේ පාටලීපුත්‍ර නගරයේ සිට ය. ඒ බව එකල විසිරී පවතින අභිලේඛන තුළින් පැහැදිලි වේ. නමුත් සමුද්‍ර ගුප්ත අධිරාජයාගේ අගනුවර කේන්ද්‍ර කරගෙන ඍජුව පාලනය මෙහෙයවන ලද්දේ උතුරු ඉන්දියාවේ සීමිත ප්‍රදේශයක් පමණි. ඒවායෙන් ඇතැමක් අධිරාජ්‍යයට අවනත බව දක්වමින් අර්ධ ස්වාධීනව පාලනය ගෙන ගිය රාජ්‍යයන් ය. මුලින් පෙන්වා දුන් පල්ලව හා ඩෙකානයේ රාජ්‍යයන් මෙසේ අවනත බව පමණක් දක් වූ රාජ්‍යයන් ලෙස හඳුනාගත හැකිය. අලහබාද් ප්‍රශස්තිය දක්වන ආකාරයේ අධිරාජ්‍යයක් ගොඩ නැගීමට ඔහුට නොහැකි වූ බව මේ කරුණුවලින් පෙනී යයි. නමුත් ඔහු දක්ෂ සටන් කාමියෙක්ය යන අදහස බැහැර කළ නොහැකි ය. ප්‍රශස්තිය දක්වන ආකාරයට ඔහුගේ ශරීරය කැළැල්වලින් අලංකාර වී තිබේ. ඒවායෙන්

අලංකාරත්වයට වඩා ඔහු විසින් නිරන්තරයෙන් සටන් වදිමින් සිය රාජ්‍යය පුළුල් කරලීමට කටයුතු කරන ලද බව අරුත් ගැන්වේ. මෙයට අමතරව හරිෂේණ ශ්‍රී ලංකාව පිළිබඳව දක්වන තොරතුරු සනාථ කිරීමට තරම් සාක්ෂි හමු වන්නේ නැත. පෙර සඳහන් කළ ආකාරයට භාරතයේ විශ්‍රාම ශාලාවක් ඉදි කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දුන් නිසා මේඝවර්ණාභය රජතුමා සමුද්‍ර ගුප්තට තුටු පඬුරු යවන්නට ඇතැයි සිතිය හැකි ය. නමුත් එයින් සිංහල දේශය සමුද්‍ර ගුප්ත අධිරාජයාගේ බලය පිළිගෙන කටයුතු කළ බවක් නම් නොපෙනේ. මේ කරුණ හරිෂේණ ප්‍රශස්තියේදී අතිශයෝක්තියෙන් සඳහන් කර ඇතැයි සිතිය හැකි ය. එසේ ම ඩෙකෑන් ප්‍රදේශය තුළ වැඩි බලයක් හිමි කර ගෙන සිටි වාකාටකයන් සමුද්‍ර ගුප්ත විසින් යටත් කළ බවට ද කිසිඳු තොරතුරක් හමු වන්නේ නැත. එසේ ම එම ප්‍රදේශයන් සමඟ සටන් කළ බවට මූලාශ්‍රයෙන් තොරතුරු හමු වන්නේ ද නැත. ශක රාජ්‍යයන් යටපත් කිරීම පිළිබඳව ද යම් ගැටලුකාරි තත්ත්වයක් පැන නගියි. දෙවන චන්ද්‍ර ගුප්ත රජ දවස ද ශකවරුන්ගේ නැඟී සිටීම හා ඔවුන් මර්දනය කිරීමෙන් පැහැදිලි වන්නේ සමුද්‍ර ගුප්ත දවස යටත් කිරීම නිවැරදි ආකාරයෙන් සිදු නොවූ බව ය.

ඉහත දැක් වූ කරුණුවලට අනුව මෙම ප්‍රශස්තිය තුළින් සමුද්‍ර ගුප්ත ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් කරා රැගෙන ගිය ආකාරය මැනවින් නිරූපිතය. ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් කරා මෙහෙය වූ පාලකයන්ගෙන් පුරෝගාමියා වන්නේ සමුද්‍ර ගුප්තයන් ය. ඔහු සටන් වීරයෙකි. එසේ ම නීති විශාරදයෙකි. කලාව හා සාහිත්‍යය නගා සිටුවීමට අනුග්‍රහය දැක් වූ කලාකාමියෙකි. එසේ ම බ්‍රාහ්මණ ආගම නගා සිටුවීම සඳහා අනුග්‍රහය දැක් වූ ද අශ්වමේධ යාගය පුනරුත්ථාපනය කිරීම සඳහා කැප වී කටයුතු කළ අයෙකු වශයෙන් ද ඔහුව හඳුනාගත හැකි ය.

ඇතැම් අසත්‍ය තොරතුරු පදනම් කරගෙන හෝ ප්‍රශස්ති ස්වරූපයක් දරන නිසා හෝ අලහබාද් ප්‍රශස්තිය විශ්වසනීයත්වයෙන් තොර, අතිශයෝක්තියට නැඹුරු ලේඛනයක් ලෙස හුවා දැක්විය යුතු නොවේ. මක් නිසාදයත් මෙම ප්‍රශස්තිය සමකාලීන වීම නිසා එහි අන්තර්ගත තොරතුරුවල කිසියම් විශ්වසනීයත්වයක් ඇති හෙයිනි. ඒ අනුව ප්‍රශස්තියේ එන ඇතැම් තොරතුරු සැක සංකාවන්ගෙන් යුක්ත

වුව ද සමකාලීන වෙනත් මූලාශ්‍රයන්ගෙන් ප්‍රශස්තියේ එන ඇතැම් තොරතුරු තහවුරු වන නිසා ගුප්ත රාජවංශයේ ඉතිහාසය හා සමුද්‍ර ගුප්තයන්ගේ ජීවන තොරතුරු අධ්‍යයනය කිරීමට ඇති වැදගත් මූලාශ්‍රයක් ලෙසින් අලහබාද් ප්‍රශස්තිය හැඳින්විය හැකි ය.

## ආන්තික සටහන්

1. පෙරේරා, එච්. සංසදාස, <u>සිංහල ප්‍රශස්ති සාහිත්‍යය,</u> කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1992, පිටුව 15.
2. <u>ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය,</u> (පරි) හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1992, පිටුව 8.
3. ''(ආ)යෙහී හීත්‍යූපගුහ්‍ය භාව - පිශුනෛරුතකර්ණතෛ රොමභිඃ - සභොෂ්‍ඡුච්ඡවසිතෙෂු තුල්‍ය - කුලජ - මලානානනොදවීක්ෂි (ත)ඃ. (සෙන) හව්‍යාකුලිතෙන වාෂප - ගුරුණා තත්වෙක්ෂිණා චක්‍ෂුෂා - යඃ පිත්‍රාභිහිතො නි(රීක්‍ෂ්‍ය) නිඛි (ලාං) පාහ්‍යෙව) (මූර්වී) මිත.'' <u>Select Inscriptions Bearing on Indian History and Civilzation,</u> vol. I. (ed) Dines Chandra Sircar, Calcutta: University of Calcutta, 1942, P. 255.
4. එච්. ටී. බස්නායක, <u>පුරාතන ඉන්දිය ශිෂ්ටාචාරය,</u> කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1998, පි. 277.
5. <u>Select Inscriptions Bearing on Indian History and Civilzation</u>, vol. I.1942, P. 261
6. <u>Ibid,</u> P. 255.
7. <u>ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය,</u> 1992, පිටුව 39.
8. ''(අදෙධ්‍යයඃ) සූකත - මාගගීඃ කවි - මති විභවොතසාරණං චාපි කාව්‍යං - කො නු ස්‍යාදේ‍යාස්‍ය න ස්‍යාද්ගුණ මති (වි)දුෂාංධ්‍යානපාත්‍රං ය එකඃ'' <u>Select Inscriptions Bearing on Indian History and Civilzation,</u> vol. I. 1942, P. 256.
9. <u>කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,</u> (අධිකාර 8-9-10-11-12-13-14-15), (පරි) හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2003, පිටුව 113.
10. <u>ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය,</u> 1992, පිටුව 44.
11. <u>එම,</u> පි. 42.
12. <u>Select Inscriptions Bearing on Indian History and Civilzation</u>, vol. I. 1942, P. 256.
13. <u>Ibid</u>, PP. 257 -258.
14. <u>කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය</u>, (අධිකාර 8-9-10-11-12-13-14-15), 2003, පිටු 44 - 45.

15. Select Inscriptions Bearing on Indian History and Civilzation, vol. I. 1942, P. 257.

16. ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය, 1992, පිටු. 45 46.

17. *Select Inscriptions Bearing on Indian History and Civilzation, vol. I. 1942, P. 261.*

18. Ibid, PP. 256 - 257.

19. ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය, 1992, පිටුව 450.

20. එම, පිටු 58 - 59.

21. බස්නායක, එම, 1998, පිටුව 282.

22. Select Inscriptions Bearing on Indian History and Civilzation, vol. I. 1942, PP. 257 - 258.

23. Ibid, P. 258.

24. ෆාහියන්ගේ බෞද්ධරාජධානි සහ වන්දනා ගමන් විස්තරය, (ක්‍රි. ව. 399 - 414) පරි. ඩබ්ලිව්. චාර්ල්ස් ද සිල්වා, බත්තරමුල්ල: ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, 2010, පිටු 112 - 113 - 114.

25. Select Inscriptions Bearing on Indian History and Civilzation, vol. I. 1942, P. 259.